චක්‍රලේඛ අංක :SSD/06/2020

මගේ අංකය : SSD/04/02/01/01

සමාජ සේවා දෙපාර්තමේන්තුව,

02 වන මහල,

සෙත්සිරිපාය, II අදියර,

බත්තරමුල්ල.

2022.09.12

දිස්ත්‍රික් ලේකම්/ ප්‍රාදේශීය ලේකම් මගින්,

සමාජ සේවා නිලධාරී,

සංවර්ධන නිලධාරී (සමාජ සේවා),

සංවර්ධන නිලධාරී (වැඩිහිටි හිමිකම්),

ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,

.....................................

**සමාජ සේවා දෙපාර්තමේන්තුව යටතේ පවත්නා වෘත්තීය පුහුණු ආයතන සඳහා 2023 අධ්‍යයන වර්ෂය වෙනුවෙන් අභ්‍යාසලාභීන් බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවීම.**

ආබාධ සහිත පුද්ගලයින් තම නිවසට, ප්‍රජාවට බරක් නොවී වැඩදායක පුරවැසියන් සේ සමාජයේ ජීවත් වීමට අවශ්‍ය දැනුම, කුසලතා හා ආකල්ප වර්ධනය කරනු වස් වෘත්තීය පුහුණුව ලබාදීම සමාජ සේවා දෙපාර්තමේන්තුවේ එක් ප්‍රමුඛ කාර්ය භාර්යක් වේ. මෙම වෘත්තීය පුහුණුව තුළින් ස්වයං රැකියාවක නිරත වෙමින් ආදායමක් උපයා ගැනීම සේම රාජ්‍ය හෝ පෞද්ගලික අංශයේ ව්‍යවසායකයකු යටතේ රැකියාවක නිරතවීමටද ඉවහල් වනු ඇත.

මේ වන විට දිවයින පුරා පිහිටා ඇති වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන මගින් වාර්ෂිකව 500 ක පමණ පිරිසක් පුහුණුව අවසන් කර පිටවෙන අතර ඉන් පිටව ගිය පිරිස් විවිධ වෘත්තීන් වල නියැලමින් ස්වෝත්සාහයෙන් ජීවත් වෙමින් ව්‍යවසායකයන් සේ කටයුතු කරන අවස්ථාද දක්නට ලැබේ.

මේ සඳහා රජය වාර්ෂික අයවැයෙන් විශාල මුදලක් වෙන් කරන අතර අදාළ වෘත්තීය පුහුණුව සඳහා සුදුස්සන් යොමු කරමින් එම මුදල නිසි ලෙස ප්‍රයෝජනයට ගැනීම සඳහා කටයුතු යෙදීම ඔබ වෙත පැවරෙන විශාල වගකීමක් වනු ඇත. එලෙස වෘත්තීය පුහුණුවක් ලැබීමට හැකියාවක් නොමැති පිරිස් වෙනුවෙන්ද වෙනත් වැඩපිළිවෙළක් යෙදීමද කාලීන අවශ්‍යතාවයකි.

සමාජ සේවා දෙපාර්තමේන්තුව යටතේ පවත්නා වෘත්තීය පුහුණු ආයතනවල වෘත්තීය පුහුණුවට බඳවා ගනු ලබන අභ්‍යාසලාභීන් පහත සුදුසුකම් සපුරා තිබීම අත්‍යාවශ්‍ය වේ.

**01. වෘත්තීය පුහුණුව සඳහා අයදුම් කිරීම.**

I. ශ්‍රී ලාංකික පුරවැසියෙක් වීම.

II. ආබාධ සහිත පුද්ගලයෙකු වීම.

III. අවිවාහක වීම.

IV. වයස් සීමාව අවුරුදු 16 – 35 අතර වීම.

V. පුහුණු පාඨමාලාවට අදාළ වන පරිදි පහත සුදුසුකම් සපුරා තිබීම.

- ස්වාධීන බව.
  - තමාගේ එදිනෙදා වැඩ තනිවම කර ගැනීමට හැකිවීම.
  - දෙමාපියන්ගෙන් වෙන්ව නිවසෙන් බැහැරව ජීවත් වීමට හැකි වීම.
- පුහුණු කළ හැකි මට්ටමේ අයකු වීම.
  - ලබාදෙන උපදෙස් තේරුම් ගෙන ඒ අනුව කටයුතු කිරීමට හැකි වීම.

  (සවන්දීම/ ග්‍රහණය කර ගැනීම/ උපදෙස් පිළිපැදීම/ අවධානය දීම/ධාරණය කර ගැනීම)
  - ආයතනගතව ඉගෙන ගැනීමේ අවම සූදානමකින් යුක්ත වීම.

**02. වෘත්තීය පුහුණුව සඳහා බඳවා ගැනීම.**

ඔබගේ පදිංචිය අනුව අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යලයට අනුයුක්ත සමාජසේවා නිලධාරී, සංවර්ධන නිලධාරි (සමාජසේවා)/ සංවර්ධන නිලධාරි (වැඩිහිටි හිමිකම්), පළාත් සමාජ සේවා නිලධාරී, උපකෘත පාසැල්වල විදුහල්පතිවරුන් හා ග්‍රාම නිලධාරීන් මගින් වෘත්තීය පුහුණුවට බඳවා ගැනීම සඳහා අයදුම්පත් ලබාගෙන ඉදිරිපත් කළ යුතුය.

**03. වෘත්තීය පුහුණුව සඳහා අභ්‍යාසලාභීන් තෝරා ගැනීම.**

සමාජ සේවා දෙපාර්තමේන්තුව විසින් නාම් කරනු ලබන නියෝජිත මණ්ඩලයක මෙහෙයවීම යටතේ කරනු ලබන යෝග්‍යතා පරීක්ෂණයක ප්‍රතිඵල මත වෘත්තීය පුහුණුව සඳහා තෝරා ගැනීම සිදුකෙරේ.

**04. වෘත්තීය පුහුණු පාඨමාලා වර්ග**

එක් එක් වෘත්තීය පුහුණු ආයතනයන්හි ක්‍රියාත්මක පුහුණු පාඨමාලා පිළිබඳ තොරතුරු චක්‍රලේඛය අවසානයේ ඇමුණුම 01 මගින් ඉදිරිපත් කර ඇති අතර ඔබ විසින් එම තොරතුරු අයදුම්පත්‍රය සමඟ අයදුම්කරුවන් වෙත ලබාදිය යුතුය.

**05. ආබාධ සහිත තත්ත්වයන්**

I. දෘෂ්‍යා ආබාධ සහිත

II. කථන ආබාධ සහිත

III. කායික ආබාධ සහිත

IV. බුද්ධිමය ආබාධ සහිත

V. ශ්‍රවණ ආබාධ සහිත

VI. සුෂුම්නා ආබාධ සහිත

## 06. වෘත්තීය පුහුණු ආයතනයන්

| අ.අ | වෘත්තීය පුහුණු ආයතනය හා ලිපිනය | දුරකථන / ෆැක්ස් / ඊමේල් |
|---|---|---|
| 01. | සීදූව වෘත්තීය පුහුණු ආයතනය<br>ලියනගේ මුල්ල, සීදූව | 0112253503<br>vtcsiduwasrilanka@gmail.com |
| 02 | අමුණුකුඹුර වෘත්තීය පුහුණු ආයතනය<br>අමුණුකුඹුර, වතුරුගම | 0332279321<br>vtiamunukumbura@gmail.com |
| 03 | කැටවල වෘත්තීය පුහුණු ආයතනය<br>කැටවල - ලෙව්ල, මහනුවර | 0812219153<br>katawalavti@gmail.com |
| 04 | වත්තේගම වෘත්තීය පුහුණු ආයතනය<br>වාවින්න, වත්තේගම | 0812476209<br>Socialservices.vtiwathttegama@gmail.com |
| 05 | තෙළඹුයාය වෘත්තීය පුහුණු ආයතනය<br>තෙළඹුයාය, අඟුණුකොළපැලැස්ස. | 0473489296<br>Telembuyaye@gmail.com |
| 06 | රාගම වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය<br>පුනරුත්ථාපන රෝහල, රාගම. | 0112958294 / 0112958212<br>ragamavtc@gmail.com |
| 07 | මාදම්පේ වෘත්තීය පුහුණු ආයතනය<br>දේවාල පාර, පොතුවිල, මාදම්පේ | 0322248568<br>Vtcssdoffice.madampe@gmail.com |
| 08 | කලවාන "විභවි" වෘත්තීය පුහුණු ආයතනය<br>පහල කුකුලේගම, මීපාගම, කලවාන | 0452255071<br>vibhawivti@gmail.com |
| 09 | මඩකලපු වෘත්තීය පුහුණු ආයතනය<br>කුඹුරුමූලෛ, වාලෙච්චේනෛ | 0653132223<br>Socialservices.vtcvalaichchenai@gmail.com |
| 10 | කිලිනොච්චි වෘත්තීය පුහුණු ආයතනය<br>අරවියර් නගර්, කරච්චි | kilinochchivti@gmail.com |
| 11 | තෝලංගමුව අනුබද්ධ වෘත්තීය පුහුණු ආයතනය, වරකාපොල | tholangamuwavti@gmail.com |

## 07. දෛනික දීමනාව

වෘත්තීය පුහුණුව ලබන නේවාසික හෝ නේවාසික නොවන අභ්‍යාසලාභීන් සඳහා දෛනික දීමනාව රු.150/- කි. මෙම දෛනික දීමනාව රජයේ ප්‍රතිපත්ති, තීරණ මත වෙනස්විය හැකි අතර මෙසේ ලබාදෙන මුදල වේතනයක් හෝ වෙනත් ව්‍යවස්ථාපිත ගෙවීමක් ලෙස නොසැළකෙන අතර පුහුණුව ලබන ආබාධා සහිත අභ්‍යාසලාභීන් ඉදිරි අනාගත කටයුතු සැලසුම් කිරීම වෙනුවෙන් දෙනු ලබන දීමනාවක් පමණි. එය අභ්‍යාසලාභීන්ගේ බැංකු ගිණුමට බැර කරන අතර පාඨමාලාව අවසානයේදී

සකස් කරන ලද තනි පුද්ගල සැලැස්ම අනුව යෝජිත ස්වයං රැකියාව සඳහා අවශ්‍ය මෙවලම් කට්ටලය ලබාදීමට අවශ්‍යතාව අනුව සුදුසු පරිදි යොදවනු ඇත.

**08. විශේෂ පහසුකම් හා අවස්ථා**

I. නොමිලේ නේවාසික පහසුකම් හා ආහාරපාන

II. නොමිලේ නිල ඇඳුම් හා දෛනික අවශ්‍යතා ( රබර් සෙරෙප්පු, යට ඇඳුම්, ගැහැණු ළමුන් සඳහා සනීපාරක්ෂක ද්‍රව්‍ය, දත් බුරුසු, දත් බෙහෙත්,සබන්, රේසර්)

III. පැමිණීම අනුව දෛනික දීමනාව

IV. නොමිලේ වෛද්‍ය ප්‍රතිකාර

V. නවීන තාක්ෂණික මෙවලම් භාවිතයට ඉඩ ප්‍රස්ථා

VI. අධ්‍යාත්මික වැඩසටහන්

VII. පෞර්ෂ සංවර්ධනය හා නායකත්ව පුහුණුව

VIII. යෞවන සමාජ පිහිටුවා ඒ හරහා ක්‍රීඩා කුසලතා වර්ධනය

IX. කලා හා සෞන්දර්ය කුසලතා වර්ධනය සඳහා විවිධ වැඩසටහන්

X. මළල ක්‍රීඩා හා කලා අංශයෙන් දක්ෂතා ඇති අභ්‍යාසලාභීන් සඳහා ජාතික හා ජාත්‍යන්තර තරඟ සඳහා අවස්ථා

XI. අධ්‍යාපන චාරිකා / විනෝද චාරිකා හා විවිධ ප්‍රසංග සඳහා සහභාගී වීමට අවස්ථාව

XII. කථන චිකිත්සක, භෞත චිකිත්සක හා වෘත්තීය චිකිත්සක සේවාවන්

XIII. පුහුණුවෙන් පසු ස්වයං රැකියාවක නිරතවන අභ්‍යාසලාභීන් සඳහා ව්‍යාපාර සැලසුම් සකස් කර ඒ අනුව උපකරණ කට්ටල සැපයීම

XIV. පාඨමාලාව අවසානයේ NVQ / පිළිගත් සහතිකයක්

XV. පුද්ගලික අංශයේ රැකියා සඳහා මාර්ගෝපදේශනය

**09. වෙනත් විශේෂිත කරුණු**

01. පිළිගත හැකි හේතුවක් මත නොදන්වා පාඨමාලාවන් අතර මග හැරයන අභ්‍යාසලාභීන් නැවත වෘත්තීය පුහුණුව සඳහා බඳවාගනු නොලැබේ. අසනීපයක් හෝ වෙනත් පිළිගත හැකි හේතුවක් මත නියමිත පාඨමාලාවට සහභාගිවීමට නොහැකි වූ අභ්‍යාසලාභීන් සඳහා සමාජ සේවා අධ්‍යක්ෂගේ විශේෂ අනුමැතිය යටතේ පුහුණු කාල සීමාව දීර්ඝ කළ හැක.

02. වෘත්තීය පුහුණුව ලබන කාලසීමාව තුළ ආයතනයට හානිදායක වන හෝ විනය නීති කඩකරමින් හැසිරෙන අභ්‍යාසලාභීන් පිළිබඳ සමාජ සේවා අධ්‍යක්ෂගේ තීරණය මත පාඨමාලාවෙන් ඉවත් කරනු ලැබේ.

03. සමාජ සේවා දෙපාර්තමේන්තුව යටතේ පවත්නා වෘත්තීය පුහුණු ආයතන වලින් වෘත්තීය පුහුණුව අවසන් කර පිටවන අභ්‍යාසලාභීන්ගේ පසුවිපරම් කටයුතු අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සමාජසේවා නිලධාරීන්, සංවර්ධන නිලධාරී (සමාජසේවා) සංවර්ධන නිලධාරී (වැඩිහිටි

හිමිකම් ප්‍රවර්ධන) හා අවස්ථානුකූලව වෘත්තිය පුහුණු ආයතන සඳහා අනුයුක්ත සමාජසේවා නිලධාරී / සංවර්ධන නිලධාරින් (සමාජසේවා) මගින් සිදු කරනු ලැබේ.

04. අභ්‍යාසලාභීන් බඳවා ගැනීමේ අයදුම්පත් සමාජ සේවා දෙපාර්තමේන්තුව වෙත 2022 ඔක්තෝම්බර් 03 දිනට පෙර ලැබීමට සැලැස්විය යුතුය.

05. අයදුම්පත් අධ්‍යක්ෂ, සමාජසේවා දෙපාර්තමේන්තුව, 02 වන මහල, II අදියර, සෙත්සිරිපාය, බත්තරමුල්ල යන ලිපිනයට එවිය යුතුය.

06. මේ සම්බන්ධයෙන් වැඩි විස්තර දැනගැනීමට අවශ්‍ය නම් 0112187042 යන දුරකථන අංකය මගින් තොරතුරු ලබාගත හැකිය.

ඩබ්.ජී.ඩී.කරුණාරත්න
අතිරේක අධ්‍යක්ෂ

අත්. කළේ/ අනෝජා හේරත්
සමාජසේවා අධ්‍යක්ෂ

පිටපත් :

01. ලේකම්, කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබල ගැන්වීම් පිළිබඳ අමාත්‍යාංශය - කරු. දැ.ගැ.ස

02. පළාත් සමාජ සේවා අධ්‍යක්ෂකවරුන් - කරු. දැ. ගැ.ස

03. ස්ථානභාර නිලධාරී , වෘත්තීය පුහුණු ආයතනය, .................- කරු. දැ. ගැ.ස හා අ.ක.ස

04. විදුහල්පතිවරුන් - උසස්කෘත පාසැල් - කරු. දැ. ගැ.ස හා අ.ක.ස

05. සභාපති / අධ්‍යක්ෂ / ස්වේච්ඡා සංවිධාන - කරු. දැ. ගැ.ස හා අ.ක.ස

## 2023 වර්ෂය සඳහා වෘත්තීය පුහුණු මධ්‍යස්ථානවල ක්‍රියාත්මකවන පාඨමාලා

| අං | වෘ.පු.ආ. | පාඨමාලාව |
|---|---|---|
| 01 | කැටවල | 01. මෝටර් සයිකල් හා ත්‍රී රෝද රථ කාර්මික ශිල්පය |
| | | 02. මෝටර් රථ පින්තාරු ශිල්පය |
| | | 03. පෑස්සුම් ශිල්පය |
| | | 04. යාන්ත්‍රික ශිල්පය |
| | | 05. මෝටර් රථ කාර්මික ශිල්පය |
| 02 | වත්තේගම | 01. බතික් ශිල්පය |
| | | 02. ඇඟලුම් කර්මාන්ත හා ආශ්‍රිත ශිල්පය |
| | | 03. ගෙවතු වගා කෘෂිකර්මය |
| | | 04. අත්කම් ශිල්පය |
| | | 05. කලා කැටයම් හා වඩු කාර්මික ශිල්පය |
| | | 06. තොරතුරු තාක්ෂණය හා ග්‍රැෆික් නිර්මාණය |
| | | 07. රූපලාවන්‍ය ශිල්පය ( සියළුම අභ්‍යාසලාභීන් සඳහා පොදු පාඨමාලාවකි) |
| 03 | තෙලඹුයාය | 01. ගෙවතු වගා කෘෂිකර්මය |
| | | 02. ආහාර තාක්ෂණය |
| | | 03. ජංගම දුරකථන, රූපවාහිනී ආශ්‍රිත උපකරණ තාක්ෂණය |
| | | 04. මෝටර් රථ කාර්මික ශිල්පය |
| | | 05. ඇඟලුම් කර්මාන්ත හා ආශ්‍රිත ශිල්පය |
| | | 06. අත්කම් ශිල්පය |
| 04 | සීදූව | 01. තොරතුරු තාක්ෂණය හා ග්‍රැෆික් නිර්මාණය |
| | | 02. ශීතකරණ හා වායුසමීකරණ කාර්මික ශිල්පය |
| | | 03. විදුලි පරිපථ තාක්ෂණය |
| | | 04. මෝටර් රථ කාර්මික ශිල්පය |
| | | 05. ජංගම දුරකථන, රූපවාහිනී ආශ්‍රිත උපකරණ තාක්ෂණය |
| | | 06. ඇඟලුම් කර්මාන්ත හා ආශ්‍රිත ශිල්පය |
| | | 07. කලා කැටයම් හා වඩු කාර්මික ශිල්පය |
| | | 08. නිල තෙරපුම් ශිල්පය |
| 05 | අමුණුකුඹුර | 01. ආහාර තාක්ෂණය |
| | | 02. සිමෙන්ති ආශ්‍රිත නිෂ්පාදන තාක්ෂණය |
| | | 03. ගෙවතු වගා කෘෂිකර්මය |
| | | 04. අත්කම් ශිල්පය |
| 06 | මාදම්පේ | 01. ඇඟලුම් කර්මාන්ත හා ආශ්‍රිත ශිල්පය |
| | | 02. තොරතුරු තාක්ෂණය හා ග්‍රැෆික් නිර්මාණ ශිල්පය |
| | | 03. අත්කම් ශිල්පය |
| 07 | මඩකලපුව | 01. ජංගම දුරකථන, රූපවාහිනී ආශ්‍රිත උපකරණ තාක්ෂණය |
| | | 02. ඇඟලුම් කර්මාන්ත හා ආශ්‍රිත ශිල්පය |
| | | 03. තොරතුරු තාක්ෂණය හා ග්‍රැෆික් නිර්මාණ ශිල්පය |
| | | 04. ගෙවතු වගා කෘෂිකර්මය |

| | | |
|---|---|---|
| 08 | කිළිනොච්චිය | 01. තොරතුරු තාක්ෂණය හා ග්‍රැපික් නිර්මාණ ශිල්පය |
| | | 02. ඇගලුම් කර්මාන්ත හා ආශ්‍රිත ශිල්පය |
| 09 | රාගම | 01. ජංගම දුරකථන, රූපවාහිනී ආශ්‍රිත උපකරණ තාක්ෂණය |
| | | 02. තොරතුරු තාක්ෂණය හා ග්‍රැපික් නිර්මාණ ශිල්පය |
| | | 03. ඇගලුම් කර්මාන්ත හා ආශ්‍රිත ශිල්පය |
| 10 | තෝලංගමුව | 01. බතික් ශිල්පය |
| | | 02. අත්කම් ශිල්පය |
| 11 | කලවාන | 01. ගෙවතු වගා කෘෂිකර්මය<br>02. අත්කම් ශිල්පය |

**වෘත්තීය පුහුණුවට තෝරා ගැනීමේ අයදුම් පත්‍රය.**

**සමාජසේවා දෙපාර්තමේන්තුව.**

01. දිස්ත්‍රික්කය :............................................ 02. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :...................................

03. ග්‍රාම නිලධාරී වසම :................................ 04. ගෘහ මූලික අංකය :........................................................

05. ගෘහ මූලිකයාගේ නම :..........................................................................................................

..........................................................................................................................................

06. ඔහුගේ / ඇයගේ ජාතික හැඳුනුම්පත් අංකය :..........................................

07. දුරකතන අංකය :.......................................

08. ආබාධ සහිත පුද්ගලයාගේ තොරතුරු :

8.1. සම්පූර්ණ නම :..........................................................................................................

8.2. ඔහුගේ / ඇයගේ ජාතික හැඳුනුම්පත් අංකය : ..................................................................

8.3. ඔහුගේ / ඇයගේ උපන් දිනය :...................................................

8.4. ඔහුගේ / ඇයගේ ස්ත්‍රී / පුරුෂ භාවය :...........................................

8.5. ඔහුගේ/ ඇයගේ ස්ථිර ලිපිනය :...............................................................................

8.6. ආබාධ සහිත තත්ත්වය :

| | | | | | |
|---|---|---|---|---|---|
| 1 | දෘෂ්‍යා ආබාධ | | 5 | බුද්ධිමය ආබාධ | |
| 2 | කායික ආබාධ | | 6 | සුසුම්නා ආබාධ | |
| 3 | ශ්‍රවණ ආබාධ | | 7 | බහු ආබාධ | |
| 4 | කතන ආබාධ | | 8 | මන්ද මානසික | |
| 9. ඖෂධ ප්‍රතිකාර ගනු ලබන රෝගාබාධ : | | | | | |
| 10. වෙනත් : | | | | | |

09. අධ්‍යාපන තොරතුරු

9.1. දැනට ලබා ඇති ඉහළම අධ්‍යාපන සුදුසුකම් :...............................................................

..........................................................................................................................

9.2. වෙනත් හැකියාවන් හා කුසලතාවයන් :...............................................................

10. රුචිකත්වය දක්වන පාඨමාලා

I.................................................................. II.................................................................

III..........................................................................................................................

10.1. පාඨමාලාව හැදෑරීමට කැමති ආයතනය : .........................................................................

11. පවුලේ විස්තර

11.1. මව / පියා / භාරකරු රැකියාවක් කරයි | ඔව් / නැත |

11.1.1.එසේනම් මාසික ආදායම් තත්ත්වය :...........................................................................................

11.2. ඔහුගේ / ඇයගේ රැකියාව :....................................................................................................

11.3. පවුලේ සිටින සහෝදර / සහෝදරියන් ගණන (අ). සහෝදරයන්...........(ආ) සහෝදරියන්.........

11.4. පවුලේ වෙනත් ආබාධ සහිත අය සිටීද? | ඔව් / නැත |

11.5. සිටීනම් ඒ කවුරුන්ද?

(අ). මව / පියා ..........................(ආ). සහෝදර / සහෝදරියන්..............(ඇ). වෙනත්................

ඉහත තොරතුරු සත්‍ය හා නිවැරදි බවට සහතික වෙමි.

.............................................
අයදුම්කරු/මව/පියා හෝ භාරකරුගේ අත්සන.

12. වෘත්තීය පුහුණුවට බඳවා ගැනීම නිර්දේශ කරමි.

.............................................
සමාජසේවා නිලධාරී / සංවර්ධන නිලධාරී (සමාජසේවා)
(නිලමුද්‍රාව)

13. ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශය

නිර්දේශ කරමි / නොකරමි

දිනය :..........................

.............................................
ප්‍රාදේශීය ලේකම්ගේ අත්සන
(නිලමුද්‍රාව)